# නව යෞවනයන් අන්තර්ජාල ක්‍රීඩාවලට යොමුවීම හරහා පවුල් සංස්ථාවට සිදු වී ඇති බලපෑම පිළිබඳ සමාජ විද්‍යාත්මක ඇගයීමක්

*එම්.ඒ. දමීෂා නෙත්මිණි [1]*

ගෝලීයකරණයේ ප්‍රතිඵලයක් ලෙස සබැඳි ක්‍රීඩාවන් ලාංකේය සමාජයට අවතීර්ණව ඇත. යෞවනයන් අන්තර්ජාල ක්‍රීඩාවලට යොමු වීමෙන් ඔවුන් අයත් කුටුම්භයන්ට සිදුව ඇති ධනාත්මක හා ඍණාත්මක බලපෑම් අධ්‍යයනය කිරීම අධ්‍යයනයේ වැදගත්කමයි. යෞවනයන් අන්තර්ජාල ක්‍රීඩාවලට යොමුවීම තුළ පවුල් සංස්ථාවට සිදු වී ඇති බලපෑමේ ස්වභාවය කවරේද යන්න හඳුනා ගැනීම අධ්‍යනයේ මූලික අරමුණ විය. නව යෞවනයන් අන්තර්ජාල ක්‍රීඩාවලට යොමුවීම හරහා පවුල් සංස්ථාවට සිදුවී ඇති බලපෑම කෙබඳුද යන්න අධ්‍යයන ගැටලුවයි. එහිදී කුටුම්භයට සිදුව ඇති බලපෑම පැතිකඩ ත්‍රිත්වයක් ඔස්සේ එනම්, ක්‍රීඩාවේ නියැලෙන්නන්ට, ඔවුන්ගේ දෙමාපියන්ට, සෙසු සහෝදර සහෝදරියන්ට සිදු වූ බලපෑම වශයෙන් සාකච්ඡාවට ලක් කර ඇත. පර්යේෂණ ක්ෂේත්‍රය වූයේ බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පානමුල්ල ග්‍රාම නිලධාරී වසමයි. ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයෙන්ම ක්‍රීඩාවේ නියැලෙන්නන් 15, ඔවුන්ගේ දෙමාපියන් 15, සෙසු පවුලේ දරුවන් 15 බැගින් ප්‍රතිචාරකයින් 45ක් සසම්භාවී නොවන හිමබෝල නියැදිය ඇසුරෙන් දත්ත ලබා ගන්නා ලදී. දත්ත රැස් කිරීමේදී ද්විතීයික සහ ප්‍රායෝගික මට්ටමෙන් ලබාගත් අත්දැකීම් ඇසුරෙන් ඍජු, වක්‍ර, සහභාගීත්ව නිරීක්ෂණයන්, ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි ඇසුරෙන් ත්‍රිකෝණබද්ධකරණය හරහා තේමා අන්තර්ගත ගුණාත්මක විශ්ලේෂණයත්, SPSS හරහා ප්‍රමාණාත්මක විශ්ලේෂණයත් උපයුක්ත කරගැනුණි. අධ්‍යයනයේ ප්‍රතිඵල අනුව ක්‍රීඩාවේ නිරතවන්නන්ට එල්ල වූ බලපෑම් 14කි. එහි ධනාත්මක බලපෑම් මෙන් දෙගුණයකට වඩා වැඩි අගයක් ඍණාත්මක බලපෑම් විය. ප්‍රධානම බලපෑම ලෙස අධියතාර්ථයේ පවතින තත්වයන් ප්‍රායෝගික ජීවිතයේ කොටසක් කරගනිමින් ආකල්පමය වශයෙන්, චර්යාත්මක වශයෙන් ප්‍රචණ්ඩකාරී වීමත්, ධනාත්මක ප්‍රතිඵල ලෙස මානසික තෘප්තිය සහ තර්කානුකූල දැනුම වර්ධනයට ඉවහල් වී ඇත. දෙමාපියන්ට සහ සෙසු දරුවන්ට ඇති වූ බලපෑම් 09කි. එහි සාධනීය බලපෑම් මෙන් තෙගුණයකට වඩා වැඩි අගයක් නිශේධනාත්මකය. ඉන් ප්‍රධානතම බලපෑම ලෙස ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ඇති වීමත්, මිල මුදල් නාස්තිය, සෙසු දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඩාල වීමත්, සාධනීය බලපෑම් ලෙස නව අදායම් මාර්ගයක් ලෙස කුටුම්භයට අන්තර්ජාල මුදල් හිමිවීමත්, ක්‍රීඩාවල නිරතවන දරුවන් හමුවේ දෙමාපියන්ට නව තාක්ෂණික දැනුම ලැබීමත් ප්‍රතිඵලය. සමස්ත පර්යේෂණය තුළින් යෞවනයන් අන්තර්ජාල ක්‍රීඩා ඇබ්බැහිව භාවිතයෙන් කුටුම්භයට සිදුකර ඇති බලපෑම කෙරෙහි සමාජ පන්තිය, ආර්ථිකය වැඩි වශයෙන් හේතු පාදකව ඇත. අධ්‍යයනයෙහි වැදගත්කම වනුයේ ඉදිරි අනාගතයේදී සමාජගත වීමට සිටින දරුවන්ට නිවැරදි මාධ්‍ය සාක්ෂරතාවයක් ලබාදෙමින් අන්තර්ජාල ක්‍රීඩා භාවිතය ඵලදායි අයුරින් කළමනාකරණය හරහා පවුල් සංස්ථාවට සිදුවන අයහපත අවම කරමින්, ධනාත්මක බලපෑම් කුටුම්භයට අවශෝෂණය කරවමින් පවුල් සංස්ථාව ඔස්සේ සමාජ සංවර්ධන කාර්යයට සහය දැක්වීමට මං පෙත් විවර කරදීමයි.

***ප්‍රමුඛ පද:*** අධ්‍යාපනය, අන්තර්ජාල ක්‍රීඩා, ආර්ථිකය, කායික හා මානසික සෞඛ්‍යය, නව යෞවනයන්

[1] සමාජ විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා කොළඹ විශ්වවිද්‍යාලය.
dameeshanethmini55@gmaiil.com